අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ : 11/2018

මගේ අංකය : MOJ/E10/E09/අධි/අභාය/චක්‍ර/2018

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ
අමාත්‍යාංශය

දිනය : 2018.10. 22

සියලුම මහාධිකරණ විනිසුරුවරුන්,
සියලුම දිසා විනිසුරුවරුන්,
සියලුම මහේස්ත්‍රාත්වරුන් හා ප්‍රාථමික අධිකරණ විනිසුරුවරුන් ,
සියලුම කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්/අතිරේක මහේස්ත්‍රාත්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

<u>සති අන්තයේ හා රජයේ නිවාඩු දිනවල රාජකාරි කිරීම වෙනුවෙන් නිවාඩු දින වැටුප් ගෙවීම</u>

01). සති අන්තයේ හා රජයේ නිවාඩු දිනවල රාජකාරි කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2013 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි. (පහසු දැනගැනීම සඳහා පිටපතක් මේ සමඟ අමුණා ඇත)

02). එහි 02(ඇ) ඡේදය අනුව ලිත් මාසයකට දින 02කට වඩා රජයේ නිවාඩු දිනවල සේවයේ නිරතවන්නේ නම් අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය පෞද්ගලිකව ඒ සඳහා ලබා ගත යුතු බව දන්වා ඇත.

03). ලිත් මසකට දින දෙක ඉක්මවා නිවාඩු දිනවල රාජකාරි කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය පෞද්ගලිකව ලබා ගැනීම ප්‍රායෝගිකව කළ නොහැකි වන හෙයින් අමුණා ඇති ආකෘති පත්‍රය අනුව රජයේ නිවාඩු දින වල රාජකාරි සඳහා වන ඉල්ලීම් අවම වශයෙන් රාජකාරි දින 03කට ප්‍රථම අමාත්‍යාංශ ලේකම්ගේ ෆැක්ස් අංක 011 2445447 වෙත ෆැක්ස් මගින් යොමු කරන ලෙස කාරුණිකව දන්වමි. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරී කේ.ඩී.සී.දිල්රුක්ෂි මිය වෙත පවරා ඇති අතර දුරකථන අංක 011 2449959 මගින් මේ පිළිබඳ විමසීම කළ හැකිය.

04). වාර්ෂික ප්‍රතිපාදන තුළ අතිකාල හා නිවාඩු දින වැටුප් කළමනාකරණය කරගත යුතු වන හෙයින් සහ මේ සඳහා අමතර ප්‍රතිපාදන භාණ්ඩාගාරය විසින් ලබා නොදෙන හෙයින් අත්‍යාවශ්‍ය අවස්ථාවන්හි හැර රජයේ නිවාඩු දිනවල රාජකාරි කිරීම සඳහා අමාත්‍යාංශයේ ලේකම් වෙත නිර්දේශ ලබා දීම ආයතන ප්‍රධානියා විසින් සීමා කළ යුතු වේ.

05). මෙම උපදෙස් පරිදි කටයුතු කරන ලෙස ඔබ ආයතනයේ පරිපාලන විෂය ප්‍රධානීන් දැනුවත් කරන්නේ නම් මැනවි.

ඩබ්.එම්.එම්.ආර්.අදිකාරි

ලේකම්

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

පිටපත : ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 21/2013

මගේ අංකය: EST-8/OVERT/04/0106
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2013.10.07

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**සති අන්තයන්හි සහ රජයේ නිවාඩු දිනවල වැඩ කිරීම වෙනුවෙන් සමහර ශ්‍රේණිවලට මුදල් ගෙවීම**

ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 10 වගන්තිය කෙරේ ඔබේ අවධානය යොමු කරවමි.

02. එහි 10:1 උපවගන්තියේ සඳහන් කොන්දේසි පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට 2013.09.05 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

(අ) නිලධරයා දිනකට පැය අටකට (08) නොඅඩුකාලයක් වැඩ කළ යුතුය.

(ආ) ලිත් මාසයකට උපරිම දින දෙකක් (02) අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පූර්ව අනුමැතිය මත සේවයේ යෙදවීමට හා ඒ අනුව අදාළ ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ) ලිත් මාසයකට දින දෙකකට (02) වැඩි දින ගණනක් සේවයේ යෙදවීම අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය පෞද්ගලිකව ලබා ගත යුතු අතර ඒ අනුව ගෙවීම් කළ යුතුය.

03. අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම පිණිස අදාළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව වෙත වාර්ෂිකව අයවැය ඇස්තමේන්තු මඟින් වෙන්කරනු ලබන ප්‍රතිපාදන සීමාව තුළ මෙම වියදම් කළමනාකරණය කර ගත යුතුය.

04. 2013.09.05 දින සිට මෙම විධිවිධාන බලපැවැත්වේ.

05. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත නිකුත් කරන ලදී.

පී.බී.අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

ඇමිණුම 01

## සති අන්ත නිවාඩු දිනවල හා ප්‍රසිද්ධ නිවාඩු දිනවල සේවයේ යෙදීම වෙනුවෙන් දින වැටුප් ලබා ගැනීම

01.නිලධාරියාගේ නම:-

02.තනතුර:-

03.සේවය කරන ආයතනය:-

04.ආයතනයේ පරිපාලන විශය භාර ප්‍රධානියාගේ ෆැක්ස් අංකය :-

(අනුමැතිය ෆැක්ස් මගින් ලබා දීම සඳහා)

05.සේවයේ යෙදීමට අපේක්ෂිත දින සහ ඉටු කිරීමට අපේක්ෂිත රාජකාරි:-

| මාසය/දිනය | සේවයේ යෙදෙන ස්ථානය | ඉටු කිරීමට අපේක්ෂිත රාජකාරි |
|---|---|---|
| අ............................ | ...................................... | .............................................. |
| ආ............................ | ...................................... | .............................................. |
| ඇ............................ | ...................................... | .............................................. |

06.සාමාන්‍ය වැඩ කරන දිනවල රාජකාරී කාලය තුළ ඉහත රාජකාරි කටයුතු ඉටු කිරීමට අපහසු වන්නේ ද යන්න

07.2018 වසරේ නිවාඩු දින රාජකාරී පිළිබඳ තොරතුරු(පසුගිය මාස සඳහා)

| මාසය | ජන. | පෙබ. | මාර්තු | අප්‍රේ. | මැයි. | ජූනි. | ජූලි. | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දින ගණන | | | | | | | | | | | | |

..........................................

ඉල්ලුම්කරුගේ අත්සන

08. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :-

ඉහත සඳහන් ..................................දිනවල/උපරිම දින.................... අදාල නිලධාරියා නියමිත රාජකාරියේ යෙදීම අත්‍යවශ්‍ය බව සහතික කරන අතර,ඒ වෙනුවෙන් නිවාඩු දින වැටුප් ගෙවීම නිර්දේශ කරමි.

දිනය : ........................

..........................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන/නිලමුද්‍රාව

10. අනුමත කරමි/ නොකරමි

දිනය : ........................

..........................................

ලේකම් අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය